# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

## නිෂ්පාදන සහ සේවා

STATISTICS DEPARTMENT
CENTRAL BANK OF SRI LANKA

## 2023 අප්‍රේල් මාසයේදී, නිෂ්පාදන හා සේවා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක පහළ යන ලදී


**පෙර වසරවලදී ද පැවති රටාවට අනුගත වෙමින්, 2023 අප්‍රේල් මාසයේ දී නිෂ්පාදන අංශයේ ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය දර්ශකාංක 34.7ක් දක්වා පහළ ගිය අතර එමගින් ඉකුත් මාසයට සාපේක්ෂව නිෂ්පාදන අංශයේ ක්‍රියාකාරකම්වල පහත වැටීමක් පෙන්නුම් කරන ලදී.** ඒ අනුව, නිෂ්පාදන, නව ඇණවුම්, සේවා නියුක්තිය, සහ තොග මිලදී ගැනුම් යන උප-දර්ශක, සෑම වසරකම පාහේ ඉහළ අගයක් වාර්තා කරන මාර්තු මාසයට සාපේක්ෂව අප්‍රේල් මාසයේදී පහත වැටුණි.

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

**34.7**

2023 අප්‍රේල්

සමීක්ෂණය සඳහා ප්‍රතිචාර දැක්වූවන්ට අනුව, නිෂ්පාදනය පහත වැටීම සඳහා මූලික වශයෙන් සිංහල සහ දෙමළ අලුත් අවුරුදු නිවාඩු හේතුවෙන් අප්‍රේල් මාසයේදී කර්මාන්තශාලා බොහොමයක් තාවකාලිකව වසා දැමීම හේතු විය. උත්සව සමයේ පැවති ඉල්ලුම අවසන් වීමත් සමඟම, විශේෂයෙන් ආහාර හා පාන වර්ග නිෂ්පාදන අංශයේ නව ඇණවුම් අඩු වීමක් දක්නට ලැබුණි. මෙයට අමතරව, රෙදිපිළි සහ ඇඟලුම් නිෂ්පාදන අංශයේ සමහර ප්‍රතිචාර දැක්වූවන් සඳහන් කළ පරිදි, ගෝලීය ඉල්ලුමෙහි අඩු වීම තව දුරටත් පැවතීමේ ප්‍රතිඵලයක් ලෙස එම අංශයේ නව ඇණවුම් පහළ යන ලදී. තවද, නව ඇණවුම් සහ නිෂ්පාදනයෙහි දක්නට ලැබුණු පහත වැටීමට සමගාමීව සේවා නියුක්තිය සහ තොග මිලදී ගැනුම් ද පහත වැටුණි. මේ අතර, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය පෙර මාසයට සාපේක්ෂව 2023 අප්‍රේල් මාසයේ දී සුළු වශයෙන් වැඩි විය.




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

| විචල්‍යය | මාර්. | අප්‍රේ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **51.4** | **34.7** | **-** | **ඉහළ යෑමක සිට පහළ යෑමක්** |
| ***උපදර්ශක*** | | | | |
| නව ඇණවුම් | 55.9 | 33.0 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| නිෂ්පාදන | 55.8 | 24.5 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 45.2 | 42.0 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 45.8 | 25.3 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 47.3 | 51.5 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ආර්ථික වාතාවරණය යහපත් වනු ඇතැයි බලාපොරොත්තුවෙන් ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන අංශයෙහි ක්‍රියාකාරකම් සඳහා වන අපේක්ෂා ඉහළ ගොස් ඇත.

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

නිෂ්පාදන අංශයෙහි ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2023 අප්‍රේල් මාසයේ දී 49.6ක දර්ශක අගයක් වාර්තා කරමින් මාර්තු මාසයේ පැවැති අගයෙහිම නොවෙනස්ව පැවතුණි.

පසුගිය මාසයට සාපේක්ෂව 2023 අප්‍රේල් මාසයේ දී ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක ඉන්දියාව, සිංගප්පූරුව, සහ එක්සත් ජනපදය යන රටවල වැඩි වේගයකින් ද රුසියාවේ අඩු වේගයකින් ද වර්ධනය විය. එසේ වුවද, යුරෝපා කලාපය, එක්සත් රාජධානිය, සහ චීනය යන රටවල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක පසුගිය මාසයට සාපේක්ෂව 2023 මාර්තු මාසයේ දී පහළ යන ලදී.

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2023 මැයි 12 වන දිනට*

---

[1] *එස්&පී ග්ලෝබල් (S&P Global) ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, ආර්ථිකයන් 40 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2023 අප්‍රේල් මාසයේ දී 49.6ක දර්ශක අගයක් වාර්තා කරමින් කඩඉම් මට්ටමට වඩා ඉතා මදක් පහළින් පැවතුනි.** මේ සඳහා නව ව්‍යාපාර, සේවා නියුක්තිය සහ නිමකිරීමට නියමිත කාර්යයන්හි සිදු වූ පහළ යෑම් හේතු විය. කෙසේ වුවද, මෙම මාසය තුළ දී ව්‍යාපාර ක්‍රියාකාරකම් සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම් අඛණ්ඩව ඉහළ ගියේය.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**


**49.6**

**2023 අප්‍රේල්**

සේවා අංශයේ නව ව්‍යාපාර පිළිබඳව සලකා බැලීමේ දී, ප්‍රධාන වශයෙන්, රක්ෂණ, ප්‍රවාහන සහ තැපැල් හා කුරියර් සේවා යන උප අංශවල දක්නට ලැබුණු පහළ යෑම් සමඟ, 2023 මාර්තු මාසයට සාපේක්ෂව 2023 අප්‍රේල් මාසයේ දී නව ව්‍යාපාර පහළ ගියේය.

ව්‍යාපාර ක්‍රියාකාරකම් අප්‍රේල් මාසයේ දී අඛණ්ඩව නමුත් මන්දගාමී වේගයකින් වර්ධනය විය. ඒ අනුව, උත්සව සමය හේතුකොටගෙන අනෙකුත් පෞද්ගලික සේවා උප අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම් සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළේය. තවද, අධ්‍යාපන සහ විදුලි සංදේශ යන උප අංශ ද මෙම මාසය තුළ සුළු වැඩිවීම් වාර්තා කර ඇත. මේ අතර, අලුත් අවුරුදු උත්සව සමයේ ඉහළ ඉල්ලුමක් සහ වට්ටම් පැවතියද, තොග සහ සිල්ලර වෙළඳාම උප අංශයට අදාළ ව්‍යාපාරික ක්‍රියාකාරකම් පසුගිය මාසයට සාපේක්ෂව නොවෙනස්ව පැවතුනි.

නව බඳවාගැනීම් සුළු වශයෙන් සිදු වුවද, සේවයෙන් ඉවත්වීම්, රැකියා සඳහා විදේශගත වීම් සහ විශ්‍රාම ගැනීම් හේතුවෙන් අප්‍රේල් මාසයේ දී සේවා නියුක්තිය අඛණ්ඩව වැඩි වේගයකින් පහළ ගියේය. මේ අතර, නිමකිරීමට නියමිත කාර්යයන්ද මෙම මාසය තුළ දී වැඩි වේගයකින් පහළ ගියේය.




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

| විචල්‍යය | මාර්. | අප්‍රේ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **55.1** | **49.6** | **-** | **ඉහළ යෑමක සිට පහළ යෑමක්** |
| | | **උපදර්ශක** | | |
| නව ව්‍යාපාර | 59.7 | 47.5 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 56.1 | 51.0 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 42.9 | 42.5 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 46.6 | 45.7 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 70.4 | 61.1 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් සාර්ව ආර්ථික තත්ත්වයේ වර්ධනය පිළිබඳව පවත්නා ධනාත්මක ආකල්ප හේතුවෙන් අප්‍රේල් මාසයේ දී වැඩිදියුණු විය.

## ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

ගෝලීය සේවා ක්‍රියාකාරකම්හි ඉහළ යෑමක් පෙන්නුම් කරමින්, ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2023 මාර්තු මාසයේ පැවති 54.4 සිට 2023 අප්‍රේල් මාසයේ දී 55.4 දක්වා ඉහළ ගියේය.

චීනය, ඉන්දියාව, එක්සත් රාජධානිය, ඇමරිකා එක්සත් ජනපදය සහ ජපානය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අනුව එම රටවල සේවා අංශය පසුගිය මාසයට සාපේක්ෂව 2023 අප්‍රේල් මාසයේ දී වර්ධනයක් පෙන්නුම් කළේය.

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2023 මැයි 12 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමුද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.